බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ

අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය.

01.සම්බන්ධ වන ආයතන

1.1. දෙපාර්තමේන්තුව : බන්ධනාගාර යොමු අංකය : ඩී8/21/බ.පරි/වැ.ප දිනය : 2017.01.31

1.2. අමාත්‍යාංශය : බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය

යොමු අංකය : MPRRH/6/2/pri/තා.සේවා/ (වැ.ප./සැ.ශි./තා.නිල.) දිනය :2017.05.09

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/B2/48/01 vol-ii දිනය:2017.05.09

1.4. ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : EST-02/02/REC/7509 දිනය:2015.10.30

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NPC/6/18/096/SR-II දිනය:2015.08.12
NSCC/3/40/094/SR 2017.10.09

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/07-01-27/01/2017 දිනය: 2017.07.25

02. පත් කිරීම් බලධාරියා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික)

3.2. ශ්‍රේණි : III, II, I ශ්‍රේණි

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

විද්‍යාත්මක මූලධර්ම මත සංවිධානය වූ ප්‍රායෝගික විෂයයන් හා සම්බන්ධ තාක්ෂණ ඥානය පිළිබඳ පුහුණුව ලබාගත යුතු ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ මූල්‍ය, මානව, භෞතික, ද්‍රව්‍යමය, තාක්ෂණික දත්ත හා සම්පත් අධීක්ෂණය, මෙහෙයවීම හා කළමනාකරණය යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයෙන් යුත් අර්ධ වෘත්තීය සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ලත් හා පුහුණුව හා පළපුරුද්ද මත කළමනාකරණ සේවා වන ඉංජිනේරු, විද්‍යාත්මක වැනි වෘත්තීමය සේවාවන්ට පරිපූරක වන්නා වූ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/ තනතුරු වල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

සටහන : විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය : MN 3 - 2016

5.2 වැටුප් පරිමාණය : රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - 57,550/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| III | පියවර 01 | 31,040/- |
| II | පියවර 12 | 36,150/- |
| I | පියවර 23 | 43,480/- |

06.සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් ඃ

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| වැඩ පරීක්ෂක | 111/11/1 | 05 | සිවිල් ඉංජිනේරුවරයාගේ කාර්යයන්වලට සහය වීම හා අවශ්‍ය කටයුතු ඉටු කිරීම |
| සැලසුම් ශිල්පි | 111/11/1 | 02 | දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුමය කාර්යයන් සඳහා සැලසුම් සකස් කිරීමේ කටයුතු සිදු කිරීම |
| තාක්ෂණ නිලධාරි(කාර්මික) | 111/11/1 | 01 | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ කාර්යයන්වලට සහය වීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව

01. වැඩ පරීක්ෂක : 05
02. සැලසුම් ශිල්පි : 02
03. තාක්ෂණ නිලධාරි(කාර්මික) : 01

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III , II හා I ශ්‍රේණි යන සියල්ලම ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ |

සටහන

I. III,II,I යන ශ්‍රේණීන්හි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තනතුරු ප්‍රමාණයෙන් 70%ක් බාහිර අයදුම්කරුවන් සඳහා වන විවෘත තරඟ විභාගයකින් සම්පූර්ණ කෙරේ.

II. සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කරගත හැකිය.

III. පුරප්පාඩු සංඛ්‍යාව තුන (03) ට අඩුනම් බඳවා ගනු ලබන්නේ විවෘත ධාරාව යටතේ පමණි.

**7.2 විවෘත බඳවා ගැනීම**

7. 2. 1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7. 2. 2. සුදුසුකම්:

7.2.2.1.අධ්‍යාපන සුදුසුකම් :

(I) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) එකවර අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තබීම.

සහ

(II) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව ඇතුළු භෞතික විද්‍යාව විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළුව තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

7. 2. 2. 2. වෘත්තිය සුදුසුකම් :

I) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉන්ජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉන්ජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

හෝ

VI) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම .

7. 2. 2 . 3. පළපුරුද්ද : අදාළ නොවේ.

7. 2. 2. 4. කායික සුදුසුකම් : සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7. 2. 2. 5. වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. 2. 3. වයස

7. 2. 3. 1. : අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු.
7. 2. 3. 2. : උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි.

7. 2. 4. බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7. 2. 4. 1. : ලිඛිත විභාගය

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

විෂය නිර්දේශය සඳහා ඇමුණුම 01 බලන්න

7.2.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7. 2. 4. 2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7. 2. 4. 3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7. 2. 4. 3. 1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7. 2. 4. 4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ : අදාළ නොවේ.

7. 2. 5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :

7. 3. 1. බඳවා ගන්නා ශ්‍රේණිය : III

7. 3. 2. සුදුසුකම්:

7. 3. 2 . 1. අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/දෙමල/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස.(සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් වීම.

7. 3. 2. 2. වෘත්තිය සුදුසුකම් :

I) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

II) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉන්ජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉන්ජිනේරු ඩිප්ලෝමාව

හෝ

IV) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

හෝ

VI) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7. 3. 2 .3. පළපුරුද්ද : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක තනතුරේ ස්ථිර කර වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති හෝ කර්මාන්ත පරිපාලක, වැඩ මූලික තනතුරු දරණ , තනතුරේ ස්ථිර කර ඇති නිලධාරියෙක් විය යුතුය.( කර්මාන්ත පරිපාලක, වැඩ මූලික තනතුරු දරණ නිලධාරීන්ට එම තනතුරේ සහ ක්ෂේත්‍රයට අදාළ පෙර තනතුරේ වසර පහ 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. )

7. 3. 2. 4. කායික සුදුසුකම් :

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7. 3. 2. 5. වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
II. නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.
III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධරයා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම අකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7. 3. 3. වයස : අදාළ නොවේ.

7. 3. 4. බඳවා ගැනීමේ ක්‍රමය: ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

7. 3. 4. 1. : ලිඛිත විභාගය

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 40% |

විෂය නිර්දේශය සඳහා ඇමුණුම 02 බලන්න

7. 3.4. 1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7. 3. 4. 2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7. 3. 4. 3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

7. 3. 4. 3. 1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

7. 3. 4. 4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7. 3. 5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර දැන්වීමක් මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම පළ කිරීම මගින් ප්‍රසිද්ධියට පත් කර අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම් : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

8.1 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

09. භාෂා ප්‍රවීණතාව : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

10. ශ්‍රේණි උසස් කිරීම : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

11.තනතුරු වලට පත් කිරීම: අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් අනෙකුත් කොන්දේසි හා විධිවිධාන අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිභාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ"

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : නව තනතුරක් බැවින් අදාළ නොවේ.

15. සෑම පත් වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර් කාලීන විධිවිධාන: අදාළ නොවේ.

සකස් කළේ : අත්සන ..........................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : සී.එස්. අමරවික්‍ර පරිපාලන නිලධා...

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ...

දිනය : 2017.11. 21

පරීක්ෂා කළේ : අත්සන : ..........................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. වෙනුර ගුණවර්ධන අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

තනතුර : බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය : 2017.11.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ

තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව: බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.

දිනය: 2017.12. 11

යොමු අංකය : MPRRH/6/2/P7'1/ [illegible]

බන්ධනාගාර දෙපාර්තමේන්තුව ........ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා [illegible]

තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

තනතුර: ලේකම්

..............................:අමාත්‍යාංශය

නිල මුද්‍රාව: ඉංජි. පී. සුරේෂ්
ලේකම්
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික
කටයුතු අමාත්‍යාංශය
අංක 356 B, ගාලු පාර, කොළඹ 03.

දිනය : ~~2017.11.~~
2018-01-02.

යොමු අංකය : PSC/EST/07-01-27/01/2017

බන්ධනාගාර දෙපාර්තමේන්තුව ........ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ශ්‍රේණිය

සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2017.07.25 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : ඒ. කුලතුංග

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව: ඒ. කුලතුංග
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දිනය : ~~2017.11.~~
2018.02.15

ඇමුණුම 01

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා බාහිර බඳවා ගැනීම් සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමේ ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : පුරප්පාඩු අනුව වසරකට වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ අභ්‍යන්තර යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත. සිතීමේ තර්කානුකූලතාවයන්, සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තිය මත හා ගණිතමය හැකියාව මැන බැලීම සඳහා බහුවරණ 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |

සකස් කළේ :
අත්සන :
නම : සී.එස්. අමරවික්‍ර
පරිපාලන නිලධා
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2017.11. 21

පරීක්ෂා කළේ :
අත්සන : එම්. වේතුර ගුණවර්ධන
නම : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
තනතුර : බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2017.11.

අත්සන :
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එච්.එම්.එන්.සී. ධනසිංහ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය : 2017.11.
නිල මුද්‍රාව :

ඇමුණුම 02.

1. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය සඳහා අභ්‍යන්තර (සීමිත) බඳවා ගැනීම් සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමේ ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද යන වග : පුරප්පාඩු අනුව වසරකට වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ අභ්‍යන්තර යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත. සිතීමේ තර්කානුකූලතාවයන්, සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තිය මත හා ගණිතමය හැකියාව මැන බැලීම සඳහා බහුවරණ 50 කින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි. |
| 02 | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඒ ඒ තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |

සකස් කළේ :
අත්සන : ..................සී.එස්. අමරවී
නම : ..................පරිපාලන නිලධ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට
දිනය : 2017.11. 21

පරීක්ෂා කළේ :
අත්සන : ........එම්. වේනුර ගුණවර්ධන
නම : අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
තනතුර : ..................බන්ධනාගාර මූලස්ථානය කොළඹ 09.
දිනය : 2017.11.

අත්සන : ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
එච්.එම්.එන්.සී. ධනසිංහ
නම : ......ාගාර කොමසාරිස් ජනරාල්
තනතුර : ......න්ධනාගාර මූලස්ථානය
දිනය : 2017.11. කොළඹ 09.
නිල මුද්‍රාව : ....................................